# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 25 දරන
# දුම්රිය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 සැප්තැම්බර් මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 සැප්තැම්බර් මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල ශත 30 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1986 අංක 25 දරන දුම්රිය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 සැප්තැම්බර් මස 05 වන දින.]

එල්. ඩී.—ඕ. 25/84

## දුම්රිය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1986 අංක 25 දරන දුම්රිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

**2.** දුම්රිය ආඥාපනතේ 38 වන වගන්තියෙහි (2) වන උප වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

200 වන අධිකාරයේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (2) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද, දුම්රියක දී හෝ සාමාන්‍යාධිකාරීවරයාගේ පාලනය යටතේ තිබෙන යම් ස්ථානයක දී මේ ආඥාපනත නොවන යම් ලිඛිත නීතියක් යටතේ වූ වරදක් සිදු කරන යම් තැනැත්තකු, දුම්රිය ස්ථානයක දුම්රිය ස්ථානාධිපතිවරයකුගේ, දුම්රියක ප්‍රධාන නියාමකවරයකුගේ හෝ දුම්රිය ආරක්ෂක සේවයේ යම් සාමාජිකයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන දුම්රිය නිලධරයකු විසින්, වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීම, සෝදිසි කිරීම සහ රඳවා ගැනීම් කරනු ලැබිය හැකි ය. එවැනි යම් නිලධරයකු විසින් එවැනි යම් තැනැත්තකු අත්අඩංගුවට ගනු ලැබූ හෝ රඳවා ගනු ලැබූ හෝ අවස්ථාවක, ඒ තැනැත්තා සම්බන්ධයෙන් නීතියට අනුව කටයුතු කිරීම සඳහා ඒ නිලධරයා විසින් ඒ තැනැත්තා නොපමාවම පොලිස් නිලධරයකු වෙත භාර දෙනු ලැබිය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.